සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வி திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය -1 කොටස | කාලය පැය 3 |
|---|---|---|

නම / විභාග අංකය .............................................................................................

**සැලකිය යුතුයි**

(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

(ii අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

(iii ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සසඳන කවය තුළ (X) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

(01) බෝසතාණෝ බුද්ධත්වයට පත් වූ පසු උන්වහන්සේගේ මුවින් පිටවූ පළමු උදාන වාක්‍යයේ මුල් පද පේළිය වන්නේ.

(1) රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං යනුවයි
(2) අනේක ජාති සංසාරං යන්නයි
(3) නිබ්බුතා නූන සා මාතා යන්නයි
(3) සමග්ගං හෝථ මා විවදත යන්නයි

(02) උදේනි රජතුමාගෙත් හදවතිකා ඇතින්නට කලගුණ සැලකීමේ අගය රජතුමාට පෙන්වා දීම තුළින් බුදුරජාණන්වහන්සේ ප්‍රකට කළ ගුණය වන්නේ

(1) තාදී ගුණය
(2) පුරිස දම්ම සාරථී ගුණය
(3) අසරණ සරණ ගුණය
(4) ගිලානෝපස්ථාන ගුණය

(03) බුදු රදුන් භික්ෂූන් වහන්සේලා සමඟ චාරිකා කළ අවස්ථාවක දී බුදුරදුන්ට ද, ධර්මයට ද, සංඝරත්නයට ද දොස් නගමින් අගුණ කියමින් හා ගුණ කියමින් පැමිණි පරිබ්‍රාජකයා හා අන්තේවාසිකයා වන්නේ

(1) බ්‍රහ්ම දත්ත හා සුප්‍රබුද්ධ
(2) පුප්පිය හා බ්‍රහ්මදත්ත
(3) සෝණදණ්ඩ හා පොට්ඨපාද
(4) සුප්පිය හා ඉසිදත්ත

(04) කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ උපවර්තන සල් උයන ප්‍රකට වන්නේ

(1) බෝසතාණෝ උපන් තැන වශයෙනි
(2) බුදුරජාණන්වහන්සේ පළමු ධර්ම දේශනය කළ තැන වශයෙනි
(3) බුදුරජාණන් වහනේ ප්‍රථම උදානය කළ තැන වශයෙනි
(4) බුදුන් වහන්සේ පිරිනිවන් පෑ තැන වශයෙනි

(05) බුදුරජාණන් වහන්සේගේ "අරහං" ගුණයට අදාළ නොවන පිළිතුර තෝරන්න.

(1) රහසින්වත් පව් නොකිරීම
(2) සියලු ප්‍රජාවන් ලැබීමට සුදුසු වීම
(3) සියලු කෙලෙස් දුරු කිරීම
(4) සුන්දර වූ නිවනට පැමිණීම



Scanned with CamScanner

(06) බුදුරජාණන්වහන්සේ ලොව ඇති බලවත්ම රෝගය ලෙස පෙන්වා දුන්නේ

(1) පිළිකාවයි (2) අපස්මාරයයි (3) කුස ගින්නයි (4) හෘදයාබාධයයි

(07) තණ්හාවෙන්, මෝහයෙන් හා මිත්‍යා දෘෂ්ටියෙන් මිදී කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව කාම සම්පත්තියෙන් ඉවත්වීම

(1) සීල පාරමිතාවයි (2) නෙක්ඛම්ම පාරමිතාවයි (3) ප්‍රඥා පාරමිතාවයි (4) වීර්ය පාරමිතාවයි

(08) මෛත්‍රී භාවනාවේ යෙදීමෙන් කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කිරීමෙන් දුරු කළ හැකි නීවරණය වන්නේ

(1) කාමච්ඡන්දයයි (2) ව්‍යාපාදයයි (3) ථීනමිද්දයයි (4) විචිකිච්ඡාවයි

(09) සමාජයේ බොහෝ දෙනා අතර ඇති ප්‍රශ්න සියයකට පිළිතුරු සැපයෙන රේරුකානේ චන්ද විමල මහ නාහිමියන් විසින් රචිත ධර්ම ග්‍රන්ථය නම්

(1) පොහොය දිනය (2) ධර්ම විනිශ්චය (3) බෞද්ධයාගේ අත්පොත (4) අභිධර්ම මාර්ගය

(10) ශ්‍රී ලාංකික දේශහිතෛෂී පිරිස් සමඟ එක් වී පරම විඥානාර්ථ නම් බෞද්ධ සමාගම පිහිට වූයේ

(1) ඕල්කට් තුමා (2) වැලිවිට සරණංකර හිමි

(3) රේරුකානේ චන්දවිමල හිමි (4) බ්ලැවැට්ස්කි මැතිණිය

(11) ශික්ෂාවක් ද ආර්ය ධනයක් ද සසර සැප දෙන පිංකම් දහයෙන් එකක් ද රාජ ධර්මයක් ද වන්නේ

(1) සමාධියයි (2) සීලයයි (3) අනුකම්පාවයි (4) කරුණාවයිත

(12) ගේහසිත ශීලය හා නිත්‍ය ශීලය ලෙස ද හඳුන්වන්නේ

(1) පන්සිල්

(2) අටසිල්

(3) අජීව අෂ්ටමක සිල්

(4) දස සිල්

(13) ජල පහසුව ද විදුලිය ද දියුණු මංමාවත් ද සුවිසල් නිවාස ආදිය ද ඇතිව හොඳින් කා බී ජීවත් වීම පමණක් මිනිසාගේ දියුණුව යැයි සිතන්නවුන් බුදු දහමෙහි සමකොට ඇත්තේ ගසා කෑමෙහි සමත් සාර ධර්ම මඟහැර යන කිලිටි දිවි පැවතුම් ඇති

(1) සූර ගිජු ලිහිණියන්ට (2) සූර කපුටන්ටය (3) සූර දිවියන්ටය (4) සූර සුනකයන්ටය

(14) බුදුරජාණන් වහන්සේ " කක්කරපත්ත" නමැති කෝලිය ගමේ 'දීඝජාණු" නමැති කෝලය පුත්‍රයාට දේශනා කළ සූත්‍රය වන්නේ

(1) කාලාම සූත්‍රය (2) විමංසක සූත්‍රය (3) පරාභව සූත්‍රය (4) ව්‍යග්ඝපජ්ජ



Scanned with CamScanner

(15) අසත් පුරුෂයන් ප්‍රියවීම, සත් පුරුෂයන් ප්‍රිය නොකිරීම, අසත් පුරුෂ ධර්මයට ප්‍රිය කිරීම යනාදී කරුණු

(1) මංගල කරුණුය (2) වසල කරුණුය (3) පිරිහීමේ කරුණුය (4) මගුල් කරුණුය

(16) කාලාම සූත්‍රය අයත් වන්නේ

(1) දීඝ නිකායටය (2) අංගුත්තර නිකායටය (3) සංයුක්ත නිකායටය (4) ඛුද්දක නිකායටය

(17) අප මහ බෝසතාණෝ දාන උප පාරමී අවස්ථාව සම්පූර්ණ කර ගත්තේ

(1) වෙස්සන්තර ජාතකය තුළිනි (2) සිවි ජාතකය තුළිනි

(3) සස ජාතකය තුළිනි (4) මහා කපි ජාතකය තුළිනි

(18) ප්‍රාග් බෞද්ධ යුගයේ පැවැති වෘක්ෂ දේව වන්දනය ලංකාවට බුදු දහම ලැබීමත් සමඟ පරිවර්තනය වූයේ

(1) බෝධි වන්දනාවටය (2) බුදු රදුන් පිදීමටය (3) චෛත්‍ය වන්දනාවටය (4) දෙවියන්ට පිං දීමටය.

(19) බුදු දහම අනුව පුද්ගල විසමත්වයට හේතුව ලෙස පෙන්වා දෙන්නේ

(1) අදෘශ්‍යමාන බලවේගවල ක්‍රියාකාරිත්වය (2) දේව කැමැත්ත

(3) තමා සිදුකළ අතීත කර්මවල විපාක (4) ස්වභාවධර්මයාගේ බලපෑම

(20) චූල්ලකම්ම විභංග සූත්‍රය අනුව දීර්ඝායුෂ විඳීමට හේතුව ලෙස පෙන්වා දෙන්නේ

(1) සත්වයන්ට හිංසා කිරීම (2) ~රහ නොගැනීම

3) තමා සතු දේ අන් අයට දීම (4) සතුන්ට දයාව දැක්වීම

(21) බුදුදහම අනුව මානසික රෝගවලින් තොරව මොහොතක් හෝ ජීවත් වන්නේ

(1) සක්විති රජවරු පමණි (2) භික්ෂූන් වහන්සේලාට පමණි

(3) රහතුන් වහන්සේලා පමණි (4) බ්‍රාහ්මණයන් පමණි

(22) ප්‍රථම ධර්ම සංගායනා ප්‍රතිඵලයක් වූ සූත්‍ර පිටකයේ එන දීඝ නිකායට අයත් ධර්ම කොටස් මුඛ පරම්පරාවෙන් රැකගෙන ඉදිරියට ගෙන ඒමේ වගකීම පැවරුනේ

(1) ආනන්ද තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවටය.

(2) සැරියුත් තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානු පරම්පරාවටය

(3) අනුරුද්ධ තෙරුන් ප්‍රධාන ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවටය

(4) සියලුම භික්ෂූන් වහන්සේලාටය

(23) ලක්දිව භික්ෂුණී සමාජයේ පළමුවෙන්ම පැවිදි වූ කාන්තාව වන්නේ

(1) විහාර මහා දේවියයි (2) අනුලා දේවියයි (3) කුසුමාසන දේවියයි



Scanned with CamScanner

(24) විද්වතුන්ගේ මතය අනුව පළමුවරට බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය වී ඇතැයි සැලකෙන්නේ

(1) දෙවනපෑතිස් රාජ්‍ය සමයේ ය
(2) ධර්මාශෝක රාජ්‍ය සමයේය
(3) කණිෂ්ඨ රාජ්‍ය සමයේ
(4) කාලාශෝක රාජ්‍ය සමයේ ය.

(25) තිවංක ප්‍රතිමා ගෘහයෙන් හමුව ඇති දුර්ලභ ගණයේ පිළිම වර්ගය නම්

(1) හිටි පිළිම (2) හිඳි පිළිම (3) සැතපෙන පිළිම (4) වංකවන හෙවත් සක්මන් පිළිම

(26) කැළණි විහාරයේ අලුත් විහාර මන්දිරයේ විශිෂ්ඨ ගණයේ චිත්‍ර නිර්මාණය කළ ශිල්පියා වන්නේ

(1) රිචඩ් හෙන්රිකස් (2) සාර්ලිස් ශිල්පියා (3) සෝලියස් මෙන්දිස් (4) ඇල්බට් ධර්මසිරි

(27) ෂඩ් භාෂා පරමේශ්වර තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත ග්‍රන්ථයකට අයත් නොවන කෘතිය කුමක්ද?

(1) සැළලිහිණි සන්දේශය (2) පරෙවි සන්දේශය (3) කාව්‍යශේඛරය (4) ගිරා සන්දේශය

(28) රාජ්‍ය පාලකයා රට වැසියාගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීම

(1) දානය නම් වේ (2) ශීලය නම් වේ (3) පරිත්‍යාගය නම් වේ (4) තපස නම් වේ

(29) "දුස්සීල ව නොසන්සුන් සිත් ඇතිව අවුරුදු සියක් ජීවත් වීමට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇතිව එක දවසක් ජීවත්වීම ශ්‍රේෂ්ඨ ය" යන අර්ථය දැක්වෙන ධම්ම පද ගාථාවේ මුල් පද පේළිය වන්නේ

(1) උට්ඨානවතෝ සතිමතෝ
(2) වාරිජෝව ථලෙ ඛිත්තෝ
(3) යෝ වේ වස්සතං ජීවේ
(4) සුජීවංඅහිරිකේන

(30) මරණින් මතු පළමු ආත්ම භාවයේ දී විපාක දෙන කර්මය නම්

(1) දිට්ඨධම්මවේදනීය කර්මය
(2) උපපජ්ජවේදනීය කර්මය
(3) අපරාපරියවේදනීය කර්මය
(4) අහෝසිකර්ම

(31) 'ආත්ම' යන්නහි සිංහල අර්ථය වන්නේ

(1) අත්ත යන්නයි (2) අපි යන්නයි (3) මම යන්නයි (4) ස්ථිර යන්නයි

(32) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යනු

(1) පංචස්කන්ධයයි (2) පංචඋපාදානස්කන්ධයයි (3) පංච ඉන්ද්‍රියයි (4) පංචවරයයි

(33) බුදුරජාණන් වහන්සේ පළමුවස් කාලය ගත කළේ

(1) විශාලා මහනුවර කූටාගාර ශාලාවේය
(2) මකුල පර්වතයේය
(3) භේෂකලා පර්වතයේය
(4) බරණැස ඉසිපතනයේ මිගදායේය

(34) බෞද්ධ සාහිත්‍යයේ සඳහන් පරිදි අවිධිමත් ලෙස ආහාර ගන්නා පුද්ගලයන් අතර භුක්තවම්තක පුද්ගලයාගේ ලක්ෂණය වන්නේ

(1) අනුන්ගේ අත් උදවු නැතිව නැගිට ගන්නට බැරි තරමට ආහාර ගැනීම
(2) නැගිට ගැනීමට බැරි තරමට ආහාර ගෙ එහිම පෙරදි සිටීම
(3) අනුභව කළ ආහාර වමාරා දමා නැවත ආහාර ගන්නා තරමට ගිජුවීම
(4) ආහාර ගත් පසු ඇඳුම ඇඳ ගැනීමටවත් බැරි තරමට, ඇඳුම ගැනවත් නොසලකා ආහාර ගැනීම



Scanned with CamScanner

(35) කණිෂ්ක ධර්ම සංගායනාවේ ප්‍රධානත්වය පැවරුණේ

(1) වසු මිත්‍ර තෙරුන්ට
(2) පාර්ශව තෙරුන්ට
(3) නාගසේන තෙරුන්ට
(4) මහාතිස්ස තෙරුන්ට

(36) ථූපාරාම චෛත්‍ය, මහියංගන චෛත්‍ය යනාදි චෛත්‍යයන්ගේ ගර්භයේ හැඩය වන්නේ

(1) බුබ්බුලාකාර (2) ඝටාකාර (3) ධාන්‍යාකාර (4) ඝණ්ඨාකාර

(37) සඳකඩ පහණින් භව චක්‍රය හෙවත් සසර ගමන නිරූපණය වන බව පැවසූ විද්වතා නම්

(1) මහාචාර්ය ගුණපාල මලලසේකර
(2) මහාචාර්ය සෙනරත් පරණවිතාන
(3) මහාචාර්ය නන්දසේන රත්නපාල
(4) මහාචාර්ය චන්ද්‍රා වික්‍රම ගමගේ

(38) "පෙදෙන් බුදු සිරිතැ - බසින් වත් සිරිත් ඇ" යනුවෙන් ආරම්භ වන කෘතිය වන්නේ

(1) සිබවළඳ හා සිබවළඳවිනිස
(2) ධර්ම ප්‍රදීපිකාව
(3) සියබස්ලකර
(4) බුත්සරණ

(39) බුදු රජාණන් වහන්සේ මහී ගංගා තීරය අසල සොඳුරු භාගයේදී දේශනා කළ සූත්‍රය නම්

(1) ධනීය ගෝපාල සූත්‍රය
(2) සිංසපා සූත්‍රය
(3) කසී භාරද්වාජ සූත්‍රය
(4) මහා සීහනාද සූත්‍රය

(40) සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන සැමියා විසින් බිරිඳට ඉටුකළ යුතුකම් අතරට නොගැළපෙන පිළිතුර තෝරන්න.

(1) ගරු කිරීම
(2) අවමන් නොකිරීම
(3) සුදුසු කල්හි සම්පත් පවරා දීම
(4) ගෙදර වගකීම් පවරා දීම

*************



Scanned with CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය II පත්‍රය

නම / විභාග අංකය ..............................................................................................

- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නය ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

(1) (i) කෝසල, බිම්බිසාර වැනි මහ රජවරු ද අනිපිඩු, විශාකා වැනි ශ්‍රාවක ශ්‍රාවිකාවන් ද බුදු රදුන්ගේ සේවය අගය කරමින් ප්‍රශංසා කළ නමුත් උන් වහන්සේ ඒවායින් උද්දාමයට පත් නොවූ සේක. මෙම සිදුවීම තුළින් ප්‍රකට වන බුදු ගුණය කුමක්ද?

(ii) ත්‍රිශික්ෂා නම් කරන්න

(iii) කල්‍යාණ මිත්‍ර ඇසුරෙන් අපේක්ෂා කරන ගුණ ධර්ම දෙකක් ලියන්න

(iii) බුදු සසුනේ සිව්වණක් පිරිස නම් කරන්න

(v) "අවිජ්ජා පච්චයා සංඛාර" මෙහි අර්ථය ලියන්න

(vi) කයනම් අසාර ය
බව නම් භයංකාරය ....... මෙම කවිය අන්තර්ගත ග්‍රන්ථය හා එහි කතුවරයා නම් කරන්න.

(vii) 'අත්ථි සුඛය' යන්න කෙටියෙන් හඳුන්වන්න

(viii) පංච බලි වලින් දෙකක් නම් කරන්න

(ix) බුදු පිළිමවල දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් දිග හැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපිත මුද්‍රාව කුමක්ද?

(x) "සමණාමයං මහාරාජ ධම්ම රාජස්ස සාවකා........ මෙම ගාථාව හා සම්බන්ධ සිදුවීම කුමක් ද?

(2) (i) දස පාරමිතාවලින් දෙකක් නම් කරන්න

(ii) ප්‍රඥාව දියුණු කර ගන්නා ක්‍රම තුන කුමක්ද?

(iii) පාරමිතා ධර්ම පුද්ගලයාගේ සමාජගත ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් කර ගන්නා ආකාරය විස්තර කරන්න.

(3) (i) වෛරය නොසන්සිඳෙන ආකාරය ගැන විස්තර කෙරෙන ධම්ම පද ගාථාව ලියන්න

(ii) ඉහත සඳහන් ගාථාවේ තේරුම ලියන්න

(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්ම පදයෙන් ඔබට ලැබෙන උපදෙස් විස්තර කරන්න.



Scanned with CamScanner

(4) (i) "ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්මිං අසති ඉදං න හෝති" මෙහි අර්ථය ලියන්න

(ii) "නාමරූප පච්චයා සළායතනං" මෙය අර්ථ දක්වන්න

(iii) හේතුඵල දහම අප දෛනිකව මුහුණ දෙන ගැටළු නිවැරදිව හඳුනා ගැනීමට ද ඒවා විසඳා ගැනීම ද උපකාර කර ගන්නා මූලික ඉගැන්වීමයි. විස්තර කරන්න.

(5) (i) තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක්ද?

(ii) එම සංගායනාව පැවැත් වූ ස්ථානය මූලිකත්වය දැරූ මහරහතන් වහන්සේ සහ දායකත්වය දැක්වූ රජතුමා පිළිවෙලින් නම් කරන්න

(iii) තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල විස්තර කරන්න.

(6) (i) සතර බ්‍රහ්ම විහාර හෙවත් චතු අප්පමඤ්ඤා නම් කරන්න

(ii) ඉහතින් දක්වන ලද කරුණුවලින් එකක් කෙටියෙන් හඳුන්වන්න

(iii) පුද්ගලයා ගුන ගරුක අයෙක් කිරීමට මෙම ගුණ ධර්ම ඉවහල් වන ආකාරය විස්තර කරන්න.

(7) කොටස් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න

(i) අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමියෝ

(ii) විපස්සනා භාවනාව

(iii) සතර අගතිය

(iii) සිංහල බෝධිවංශය

Scanned with CamScanner

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**11 වසර බුද්ධ ධර්මය I පත්‍රය පිළිතුරු**

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | - | 2 | (21) | - | 3 |
| (2) | - | 3 | (22) | - | 1 |
| (3) | - | 2 | (23) | - | 2 |
| (4) | - | 4 | (24) | - | 3 |
| (5) | - | 4 | (25) | - | 4 |
| (6) | - | 3 | (26) | - | 3 |
| (7) | - | 2 | (27) | - | 4 |
| (8) | - | 2 | (28) | - | 1 |
| (9) | - | 2 | (29) | - | 3 |
| (10) | - | 1 | (30) | - | 2 |
| (11) | - | 2 | (31) | - | 3 |
| (12) | - | 1 | (32) | - | 1 |
| (13) | - | 2 | (33) | - | 4 |
| (14) | - | 4 | (34) | - | 3 |
| (15) | - | 3 | (35) | - | 2 |
| (16) | - | 2 | (36) | - | 4 |
| (17) | - | 2 | (37) | - | 2 |
| (18) | - | 1 | (38) | - | 3 |
| (19) | - | 3 | (39) | - | 1 |
| (20) | - | 4 | (40) | - | 3 |

(1x40 = 40)

## II වසර බුද්ධ ධර්මය II පත්‍රය පිළිතුරු

(1) (i) තාදී ගුණය/අටලෝ දහමින් කම්පාවට පත්නොවීමේ ගුණය/අකම්පස ගුණය

(ii) ශීල, සමාධි, ප්‍රඥා හෝ සමාන අරුත්

(iii) ශ්‍රද්ධා, ශීල, ත්‍යාග ප්‍රඥා මින දෙකක්

(iv) භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා

(v) අවිද්‍යාව හේතු කොට ගෙන සංස්කාර ඇතිවේ

(v) බුදුගුණ අලංකාරය - වීදාගම මහා මෛත්‍රීය නාහිමිපාණන් වහන්සේ

(vi) උත්සාහයෙන් හා දැතේ ශක්තියෙන් දහඩිය වගුරවමින් ධාර්මිකව උපයා සපයා ගත් ධනයක් තමන්ට ඇතැයි සිතා යමෙක් සතුටට පත්වීම

(vii) අතිථිබලි, පුබ්බපේතබලි, රාජබලි, ඤාති බලි, දේවතා බලි

(viii) අභය මුද්‍රාව

(xi) මහින්දාගමනය හෝ උචිත පිළිතුරු

(2) (i) දාන, සීල, කෙක්ඛම්ම, ප්‍රඥා, වීර්යය, ක්ෂාන්ති (ඉවසීම) සත්‍යය අධිෂ්ඨාන මෙත්තා (මෛත්‍රී) උපේක්ඛා හෝ ගැළපෙන පිළිතුරු

(ii) සිතීම (චින්තාමය ප්‍රඥා)

ගුරුතුමාට සවන්දීම, පොත පත කියවීම (සුතමය ප්‍රඥ)

භාවනාවෙන් නුවණ දියුණු කර ගැනීම (භාවනාමය ප්‍රඥා)

(iii) බුද්ධත්වය ප්‍රාර්ථනා කරන උතුමන් විසින් පුරනු ලබන උතුම් පිළිවෙත් දහය පාරමිතා හෙවත් බුද්ධ කාරක ධර්ම නම් වේ. මෙම ගුණ ධර්ම තිවන් පසක් කර ගැනීමට පමණක් නොව පුද්ගලයාගේ මෙලොව ජීවිතය යහපත් කර ගැනීමට ද උපකාරී වේ. දාන, සීල, නෙක්ඛම්ම, ප්‍රඥා, වීර්ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන මෛත්‍රි, උපේක්ෂා යනාදී සැම පාරමිතාවකින්ම පුද්ගලයාට තම සමාජගත ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය පදනම වැටෙයි දානය නැති අයහපත් සිතුවිලි ඉවත්ව ගොස් මෛත්‍රී සහගත සිත වර්ධනය වේ. ලෝභ, ද්වේෂ, මෝහ ආදී අකුසල සිතුවිලි ඉවත්වීමට දානය උපකාරී වේ.

සීලය යනු කායික වාචසික සංවරයයි. සිල්වත්ව ක්‍රියා කිරීමෙන් ඔහු පවින් වළකී. අනුන්ගේ දේපළ, ජීවිත සුරකී, චතුර්විධ වාචසික සංවර්ය ඇති කර ගනී. ඔහු සමාජයේ පිළිගත් තැනැත්තෙක් බවට පත්වේ. සමාජය තුළ සමගිව, සහයෝගීව ජීවත්වේ.

නෙක්ඛම්ම පාරමිතාව වඩන්නා අනිසිකාම සම්පත් භුක්ති විඳීමෙන් වළකියි. අසීමිත ආශාවලින් තොරව ක්‍රියා කිරීම නිසා අඩු බලාපොරොත්තු තබා ගෙන අල්පේච්ඡතාව යුතුව ජීවත් වීමට පෙළඹේ. මානසික සමබරතාව ද, මධ්‍යස්ථව තීන්දු ගැනීමට ද මෙම තත්ත්වය හේතුවේ.

ප්‍රඥාව යනු නුවණයි. නුවණින් යුතුව කටයුතු කිරීම සමාජගත ජීවිතයට ඉතා වැදගත්ය. නිවැරදි දැක්ම සැම කටයුත්තකම සාර්ථකත්වයට හේතු වේ. ප්‍රාව වැඩි දියුණු කරගැනීමට ඇති මාර්ග අනුව කටයුතු කිරීම තුළින් තමාගේ අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. ගුණ නුවණ
වැඩේ. වැඩිහිටි ගෞරවාදරයට පාත්‍රවේ.

(අනෙක් පාරමිතාවන් ද සම්බන්ධ කරගෙන ලියා ඇති කරුණු සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න. අවම වශයෙන් පාරමිතා 03 ක් වත් සම්බන්ධ කර ගෙන ලියා ඇති පිළිතුරුවලට උපරිම ලකුණු දෙන්න.

(3) (i) අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මේ
යේ තං උපනයිහන්ති
වෙරං තේසං න සම්මති

(ii) අසවලා මට බැන්නේ ය. මට පහර දුන්නේ ය. මා පැරදවූයේ ය. මා සතු දේ පැහැර ගත්තේ ය යනුවෙන් යම් අය නැවත නැවතත් සිතමින් වෛර බඳිත් නම් ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ

(iii) ධම්ම පදය බෞද්ධයාගේ හස්ථසාර ග්‍රන්ථය හෙවත් බෞද්ධයාගේ අත්පොත වශයෙන් හඳුන්වයි. මෙම ග්‍රන්ථය සියලු දෙනාටම පරිහරණය කළ හැකි වටිනා උපදෙස් ඇතුළත් ග්‍රන්ථයකි. මෙහි දැක්වෙන ගාථා මගින් හොඳ නරක තෝරා බේරා ගැනීමට සිත සංවර කර ගැනීමට, මනා සිහිය පවත්වා ගැනීමට, උත්සාහයෙන් වීර්යයෙන් ක්‍රියා කිරිමට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දෙයි. සහයෝගයෙන්, සමඟියෙන් ක්‍රියා කිරීමෙන්, චාම් සරල ජීවිතයක් ගොඩනගා ගෙන ජීවත් වීමට ද අවශ්‍ය උපදෙස් සපයන ග්‍රන්ථයකි. (මෙම කරුණු හෝ වෙනත් උචිත කරුණු සහිත ගාථා 3 ක් වත් උදාහරණ වශයෙන් ලියා ඇති පිළිතුරු වලට උපරිම ලකුණු දෙන්න.)

(4) (i) මෙය ඇති කල්හි මෙය වේ මෙය නැති කල්හි මෙය නොවේ
(ii) නාමරූප හෙවත් පංචස්කන්ධය හේතු කොට ගෙන ඇස, කන, නාසය, දිව, ශරීරය මනස යන ආයතන පහළ වේ.

(iii) බුදු දහමේ දැක්වෙන ප්‍රධාන ඉගැන්වීමකි හේතුඵල දහම, හේතුපල දහමින් අපගේ සසර ගත දුකත් සමාජගත දුකත් ඇතිවන ආකාරය හා නැතිවන ආකාරය පැහැදිලි කෙරේ. අපගේ පාලනය ඇතිව හෝ නැතිව සිදුවන ඕනෑම සිදුවීමක් තුළම මෙම හේතුපල දහම ක්‍රියාත්මක වේ. උදාහරණයක් වශයෙන් පංතියේ සිටින දක්ෂ ශිෂ්‍යයෙකු හා ඉගෙනුමට පසුබට ශිෂ්‍යයෙකු ගෙන වෙන් වෙන්ව ඒ සඳහා හේතු සාධක විමසා බැලූවිට කරුණු රැසක් අනාවරණය කර ගත හැකිවේ. ඉගෙනුමට දක්ෂ සිසුනගේ කැපවීම, උනන්දුව, උත්සාහය, බුද්ධි මට්ටම වැඩිවීම, දෙමාපිය අවධානය ලැබීම යනාදි කරුණුත් අදක්ෂ ශිෂ්‍යයා පිළිබඳ හේතු සළකා බැලූ විට කුසීතකම, අඩු බුද්ධි මට්ටම, දෙමාපිය අවධානය අඩුකම පසුබට බවට හේතු විය හැකිය. මේ ආදී වශයෙන් හේතුඵල දහම අනුව ගැටළු ඇතිවන ආකාරයත් ඒවා නැති කර ගන්නා ආකාරයත් හඳුනා ගත හැකිවේ.

(5) (i) ලාභ අපේක්ෂාවෙන් දුසිල් භික්ෂූන් සසුන් ගතවීම
(ii) පැවැත් වූ ස්ථානය - පැළලුප් නුවර අශෝකාරාමය
මූලිකත්වය - මොග්ගලී පුත්ත මහ රහතන් වහන්සේ
දායකත්වය - ධර්මාශෝක මහරජු

(iii) ථෙරවාදී සාසන ඉතිහාසයේ ඉතා වැදගත් ධර්ම සංගායාවක් වශයෙන් තුන්වන ධර්ම සංගායනාව හැඳින්විය හැකිය. මෙම ධර්ම සංගායනාව බුදු සසුනේ චිරස්ථිතියට බෙහෙවින් උපකාරී වූ ධර්ම සංගායනාවකි. මෙහි ප්‍රතිඵල අතර පහත කරුණු ප්‍රමුඛ වේ.

- දුසිල් මහණුන් හැට දහසක් සුදුවත් හන්දවා සසුනෙන් නෙරපීම
- ශාසනික පිළිවෙත් නැවත ආරම්භ කිරීම
- කථාවත්ථුප්‍රකරණය ඇතුළත් කර අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම
- ත්‍රිපිටකයම අංග සම්පූර්ණ වීම
- දේශීය විදේශීය ධර්ම ප්‍රචාරය මෙම කරුණු කෙටියෙන් විස්තර කිරීම

(6) (i) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා

(ii) පිළිතුර සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න

(iii) සතර බ්‍රහ්ම විහරණ හෙවත් චතු අප්පමඤ්ඤා යනු මෙත්තා, කරුණා, මුදිතා හා උපේක්ෂා යන ගුණ ධර්ම හතරයි. බුදු දහම උගන්වන කේන්ද්‍රීය සාරධර්ම එමගින් අර්ථවත් වන්නේ ය. පුද්ගලයකු ගුණගරුක අයෙකු බවට පත් කිරීමට උපකාරීවන මෙම ගුණ ධර්ම දේශපාලන මූලධර්මයක් වශයෙන් ද ව්‍යවහාරයට පත්ව ඇත.

මෙත්තා හෙවත් මෛත්‍රිය යනු හිතවත්කමයි. මිතුරුකමයි. පුද්ගලයා ගුණගරුක අයෙකු බවට පත්වීමට බෙහෙවින් මෙම හිතවත්කම බලපායි. මෙම ලක්‍ෂණය ඇති පුද්ගලයාගෙන් කිසිම ප්‍රාණියෙකුට විපතක් සිදු නොවේ.

කාරුණිකව නම් දුකට පත් වූවන් දුකෙන් මුදවා ගැනීම සඳහා සිතෙහි ඇතිවන අනුකම්පාවයි. මෙම ගුණාංගය ඇති විට දුක්, කම්කටොලු සහිත තැනැත්තන් ගේ දුක නැති කිරීමට පෙළඹෙයි. එය ගුණ ගරුක පුද්ගලයාගේ යහපත් ලක්‍ෂණයකි.

අනුන්ගේ සැපත දියුණුව දැක සතුටට පත්වීම මුදිතාවයි. මුදිතාව ඇති විට ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, පළිගැනීම වැනි අවගුණ බැහැර වී දයාව, කරුණාව යනාදී උතුම් ගුණ පතිත වේ.

උපේක්ෂාව යනු යෙමකුගේ සිත තුල උපදින මැදහත් බවයි. කිසිම දෙයක් කෙරෙහි ඇළුම් ගැටීම්වලින් තොරව මධ්‍යස්ථව උපේක්ෂා සහගතව සිතා බලා ක්‍රියාකිරීමට පුද්ගලයා පොළඹවන්නේ මෙම ගුණාංගය තුළිනි. ජීවිත කාලය තුළ දී නින්දා, අපහාස, ලාභ, අලාභ ආදී කිසිවකින් අකම්පිතව ක්‍රියා කිරීම නිසා ඔහුගේ ජීවිත සැනසිලි දායක වේ. එබැවින් සිව්බඹ විහරණ සහිත පුද්ගලයා ගුණ ගරුක පුද්ගලයකු බවට පත්වේ.

(7) (i) වැලිවිට අසරණ සරණ සරණංකර මහනාහිමියෝ

1968 ජුනි 18 දින උඩරට තුම්පනේ ප්‍රදේශයේ වැලිවිට ග්‍රාමයේ කුලතුංග බණ්ඩාර නමින් උපත ලද මොහු වයස 16 දී වැලිවිට සරණංකර නමින් පැවැදි බිවට පත්විය. උන්වහන්සේ බොහෝ දේ උගත්තේ ස්වෝත්සාහයෙනි.සිංහල, පාලි, සංස්කෘත, බුද්ධධර්මය, කාව්‍ය ශාස්ත්‍රය හා තවත් බොහෝ විෂයයන් පිළිබඳ හසල දැනුමක් ලබා ගත්හ.ශික්ෂාකාමී අල්පේච්ඡජීවිතයක් ගත කළ උන්වහන්සේ යැපුනේ පිඬුසිඟා වැඩීමෙනි. එමෙන්ම, ගමින් ගමට වඩිමින්, දහම් දෙසමින් අසරණයන්ට පිහිට වූහ. මහනුවර යුගයේ ඇති වූ ශාසනික පරිහානිය හේතුවෙන් සසුන නඟා සිටුවීමට ශාසන මාමක පිරිසක් එකතු කොට සිල්වත් සමාගම පිහිටුවා ගත්හ.

කීර්ති ශ්‍රී රාජසිහ රජුගේ උපාකර ඇතිව සියම් රටින් උපසම්පදාව රැගෙන විත් මෙහි සසුන පිහිටවූහ. 1953 උන් වහන්සේ ඇතුළු 06 නමක් මෙරටදී උපසම්පදාව ලබා ගත්හ. බුදු සසුන වෙනුවෙන් කළ සුවිශාල මෙහෙවරට උපහාර වශයෙන් රජතුමා විසින් උන්වහන්සේට සංඝරාජ පදවිය  පිරිනමන ලදී.

බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කරවා නිසි පූජා පැවැත්වීමට කටයුතු කළ උන්වහන්සේ මුණි ගුණාලංකාරය, සරාර්ථ සංග්‍රහය, රතනසූත්‍රය ප්‍රණාම ගාථා සතර බණවර සන්නය ආදී කෘති ද රචනා කළහ. අපිරිමිත ශ්‍රද්ධාවෙන් අල්පේච්ඡ ජීවිතයක් ගත කළ උන්වහන්සේ වයස අවුරුදු 80 ක් ආයු වළඳා 1778 ඇසළ පුර පසළොස්වක පොහෝදා අපවත් වී වදාළහ.

(ii) විපස්සනා භාවනාව - බෞද්ධ භාවනාව ප්‍රධාන ප්‍රභේද දෙකකට බෙදේ. සමථ හා විපස්සනා යනු එම ප්‍රභේද දෙකය මින් විපස්සනා භාවනාව යනු පංචස්කන්ධය දෙස ගැඹුරින් බැලීමයි. ප්‍රඥා භාවනාව, තිලකුණු භාවනාව වශයෙන්ද මෙම භාවනාව හඳුන්වයි. ජීවිතය හා ලෝක පිළිබඳව ගැමුරින් තිලකුනු අනුව සිතා බැලීමෙන් ජීවිතයේ යථා ස්වභාවය වන වටහා ගත හැකිය. විදර්ශනා භාවනාවට වැඩීම තුලින් ශරීරයේ අස්ථිර බව, දුක් සහති බව, පිළිකුල් බව, යනාදී කරුණු පිළිබඳ අවබෝධයක් ලැබේ. ප්‍රඥාව පහළ වී නිර්වාණ- යද ''සාක්ෂාත් කිරීමට'' මෙම භාවනා උපකාරී වේ.

ජීවිතයේ හා ලෝකයේ යථා ස්වභාවය අවබෝධවන විට අවට ලෝක ධර්මයට මධ්‍යස්ථව මුහුණ දීමට පෙළඹේ. විදර්ශනාව ඇති වීම කායික මානසික වේදනා, දුක් පීඩා විද දරාගෙන මානසික සුවය ඇති කර ගැනීමට හැකිවේ.

(iii) සතර අගතිය - අගතිය යනු නිතියට යුක්තියට ධර්මයට පටහැනිව ක්‍රියා කිරීමයි. මෙම කරුණු හතර ඡන්දය, ද්වේශය, භය හා මෝහයයි. රාජ්‍ය පාලනයෙන් මෙම කරුණු හතර අනුව ක්‍රියා කරන්නේ නම් ඔහු අවක්‍ෂයේ සඳ මෙනි. පිරිහෙන බවත් එම කරුණුවලින් තොරව කටයුතු කරන පාලකයා පුර පක්‍ෂයේ සඳ මෙන් වැඩෙන බවද බුදුන්වහන්සේ වදාළහ.

(iv) සිංහල බෝධි වංශය - පාලි බෝධි වංශයේ සිංහල පරිවර්තනයක් වූ මෙම කෘතිය කුරුණෑගල යුගයට අයත් වේ බෝධි සත්වයන් වහන්සේ බුද්ධත්වය ලබා ගැනීමේ දී සෙවණ දුන් ජය ශ්‍රී මහා බෝධය ලංකාවට වැඩමවීම, අෂ්ටඵල රුක බෝධි, දෙසිත්ඵල රුක බෝධි රෝපණය ආදී විස්තරද මෙහි දක්නට ලැබේ.